[Public]

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2023 සැප්තැම්බර් 14 |

## ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ දෙවන ජාතික අවදානම ඇගයීමේ සංක්ෂිප්ත වාර්තාව නිකුත් කරයි.

2021/22 වර්ෂය සඳහා වන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම ඇගයීමේ සංක්ෂිප්ත වාර්තාව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමඟ එක්ව සිදු කළ ජාතික අවදානම ඇගයීම මත පදනම්ව සකස්කර ඇත. රට තුළ පවතින මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනා ගැනීම මෙම ඇගයීමෙහි අරමුණ විය. මෙම ඇගයීම මගින් ශ්‍රී ලංකාව මුහුණ දෙන වඩාත්ම සැලකිය යුතු මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ තර්ජන, ඒවා නතුවීමට ඇති ඉඩකඩ සහ අවදානම් ඉස්මතු කරයි.

මෙම ජාතික අවදානම ඇගයීම මගින් ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය ජාවාරම, අල්ලස් හා දූෂණය, සහ වෙළඳාම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය ඇතුළු රේගු ආශ්‍රිත වැරදි, වඩාත් බහුලව පවතින මුදල් විශුද්ධිකරණයට අදාළ මූලික වැරදි ලෙස හඳුනාගෙන ඇති අතර, ඒවා අදාළ මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටම ඉහළ-මධ්‍යම අගයක පවතින බවට ශ්‍රේණිගත කර ඇත. වංචා සිදුකිරීම්, මංකොල්ලකෑම් සහ පාරිසරික හා ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධවල මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටම මධ්‍යම මට්ටමේ පවතියි. මිනිස් වෙළඳාම/ජාවාරම, බදු ආශ්‍රිත වැරදි සහ නීති විරෝධී හා අවිධිමත් අන්දමින් මසුන් ඇල්ලීම සිදුකරන්නන් නිරතවන ජාවාරම් සම්බන්ධයෙන් පහළ-මධ්‍යම මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටමක් ඇති බවට තක්සේරු කර ඇති අතර, මුදල් ව්‍යාජානුකරණය සම්බන්ධයෙන් පහළ මුදල් විශුද්ධිකරණ තර්ජන මට්ටමක් නිරීක්ෂණය කර ඇත.

තවද, ජාතික අවදානම ඇගයීම යටතේ මූල්‍ය සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීය අංශයන් හි හඳුනාගත් මුදල් විශුද්ධිකරණ අවදානම් පහත පරිදි වේ:

| අංශය | මුදල් විශුද්ධිකරණ අවදානම |
|---|---|
| අවිධිමත් ලෙස මුදල් ප්‍රේෂණ කරන්නන් (හවාලා/උන්ඩියල්) | ඉහළ |
| නිශ්චල දේපළ නියෝජිතයන් | ඉහළ මධ්‍යම |
| බැංකු අංශය | ඉහළ මධ්‍යම |
| මූල්‍ය සමාගම් | ඉහළ මධ්‍යම |
| මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් | මධ්‍යම |
| කොටස් තැරැව්කරුවන් | මධ්‍යම |
| ප්‍රාථමික අලෙවිකරුවන් | මධ්‍යම |
| කැසිනෝ | මධ්‍යම |
| මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන්නන් | මධ්‍යම |
| නොතාරිස්වරු | මධ්‍යම |
| නීතිඥවරු | මධ්‍යම |
| ගණකාධිකාරීවරු | පහළ මධ්‍යම |

| | |
|---|---|
| භාර හෝ සමාගම් සේවා සපයන්නන් | පහළ මධ්‍යම |
| රක්ෂණ අංශය | පහළ මධ්‍යම |

එහිදී, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සමස්ත අවදානම **මධ්‍යම** අගයක පවතින බව තක්සේරු කර ඇත.

ජාතික අවදානම ඇගයීම මත පදනම්ව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ මෙරට මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා හඳුනාගත් දුර්වලතා සඳහා විසඳුම් සෙවීමට එක් එක් පාර්ශ්වකරුවන් සඳහා පුළුල් ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ එක් එක් පාර්ශ්වකරුවන් සඳහා වන ක්‍රියාකාරී සැලසුම් සඳහා 2023.08.07 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ නීතිවලට අවශ්‍ය සංශෝධන ගෙන ඒම, නව නීති හඳුන්වාදීම, ආයතනික රාමු ශක්තිමත් කිරීම, විමර්ශකයින්, නඩු පවරන්නන්, අධිකරණය හා අධීක්ෂණයන්ට සම්බන්ධ පුද්ගලයින්ගේ ශක්‍යතාවයන් ගොඩනැගීම, සහ නිශ්චල දේපළ නියෝජිතයන්, මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන්නන්, කැසිනෝ, ගණකාධිකාරීවරුන් හා නීතිඥයින් වැනි නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්වල අධීක්ෂණ ක්‍රියාමාර්ග වැඩි කිරීම ඇතුළත් නිර්දේශ රැසක් ජාතික අවදානම ඇගයීම මගින් නිර්දේශ කර ඇත. තවද, විස්තරාත්මක දත්ත පද්ධතියක් සකස් කිරීම මෙන්ම මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ නඩු පැවරීම් සහ නඩු කටයුතු අවසන් කිරීම කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය ද මේ යටතේ හඳුනාගෙන ඇති අතර, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අන්තර් ආයතන සහයෝගීතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ජාතික අවදානම ඇගයීමේ සංක්ෂිප්ත වාර්තාවේ පිටපත් මූල්‍ය බුද්ධි ඒකකයේ වෙබ් අඩවියෙන් (http://fiusrilanka.gov.lk) සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් (https://www.treasury.gov.lk) ලබා ගත හැකිය.

2021/22 ජාතික අවදානම ඇගයීම යනු ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් 2014 වසරේ දී සිදු කළ පළමු ඇගයීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද දෙවන ඇගයීමයි. මෙම ඇගයීම 2016-2022 කාලසීමාව ආවරණය කරමින් සිදු කරන ලද අතර, අදාළ සියලුම දත්ත සහ සංඛ්‍යාලේඛන, මූලික ක්‍රියාකාරී කණ්ඩායම් නියෝජනය කරන ලද පාර්ශ්වකාර නියෝජිතායතන ඇතුළුව සියලු පාර්ශ්වකාර නියෝජිතායතන වලින් ලබා ගන්නා ලදී. මෙම ජාතික අවදානම ඇගයීම සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍ය තාක්ෂණික සහාය සහ ක්‍රමවේදය ලෝක බැංකුව මගින් සපයන ලදී.

ජාතික අවදානම ඇගයීම යනු, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අවදානම්වලට රට නිරාවරණය කරන තර්ජනයන් සහ ඊට නතුවීමට ඇති ඉඩකඩ මෙන්ම ඉහළ අපරාධ ආදායමක් උපයන වැරදි හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා රටක් විසින් ක්‍රියාත්මක කළ යුතු වැදගත් පියවරකි. මූල්‍ය පද්ධතිය හරහා සිදුවිය හැකි නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධ කර ගැනීමට මෙන්ම අවදානම් අවම කිරීමේ උපාය මාර්ග පිළිබඳ දැනුම්වත් වීමට ද රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයටම පවතින වැදගත් මූලාශ්‍රයක් ලෙස මෙම ඇගයීම සැලකිය හැකිය.

විවිධ සාපරාධී අංශවලින් ඇතිවන බලපෑම් හා ජාතික ආරක්ෂාවට එල්ල වන තර්ජන මගින් රටේ ආර්ථිකය සහ මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමට මෙන්ම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මගින් එල්ල වන තර්ජන ප්‍රමාණවත් ලෙස විසඳීමට පියවර ගනිමින් සුරක්ෂිත සහ ශක්තිමත් මූල්‍ය පද්ධතියක් සහතික කිරීමට ඇති රජයේ කැපවීම මෙම ඇගයීම මගින් අවධාරණය කරයි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රබල දේශපාලන කැපවීමක් පැවතීම අතිශය වැදගත් වන අතර, රට තුළ මූල්‍ය අපරාධ, අල්ලස්, දූෂණ, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වගවීම, විනිවිදභාවය, අවංකභාවයෙන් යුත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට රජය කැපවී සිටී.

තවද, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ඒකාග්‍රතාවය සුරක්ෂිත කර ගැනීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් විසින්, මෙතැන් සිට, පවතින අවදානම් පරිසරය වඩා හොඳින් අවබෝධ කර ගනිමින් ඉහළ අවදානමක් සහිත ක්ෂේත්‍රවලට ඵලදායී ලෙස සම්පත් වැඩි වශයෙන් වෙන් කිරීමට කටයුතු කළ හැකිය.

මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය මෙම ජාතික ප්‍රයත්නයට සහභාගී වූ පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවලට ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනියි. මූල්‍ය බුද්ධි ඒකකය මෙම ඇගයීම් ක්‍රියාවලියට නායකත්වය දුන් අතර මුදල් අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, බලපත්‍රලාභී වාණිජ බැංකු, කැසිනෝ, දේපළ වෙළඳාම් නියෝජිතයින්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන හා අධීක්ෂණ දෙපාර්තමේන්තු වන බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව හා ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් 66 ක නිලධාරීන් 150 ක් පමණ මෙම ඇගයීමට දායකත්වය දක්වන ලදී.